සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations Sri Lanka Department of Examinations Sri Lanka

38393

**85 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
**General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)**

| | | |
|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව | I, II | පැය තුනයි |
| மனைப் பொருளியல் | I, II | மூன்று மணித்தியாலம் |
| Home Economics | I, II | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ගෘහ ආර්ථික විද්‍යාව I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ප්‍රෝටීන්වල කෘත්‍යයක් වන්නේ
(1) ශක්තිය ලබාදීමයි.
(2) ශරීර උෂ්ණත්වය යාමනය කිරීමයි.
(3) අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ආරක්ෂා කිරීමයි.
(4) අන්ත්‍රවල ක්‍රමාකුංචනය වේගවත් කිරීමයි.

**2.** අසංතෘප්ත මේද අම්ලයක් වන්නේ මින් කුමක් ද?
(1) පාම්ටික් අම්ලය
(2) ලෝරික් අම්ලය
(3) ලිනොලෙයික් අම්ලය
(4) ස්ටියරික් අම්ලය

**3.** හිතකර මේද අඩංගු ආහාර ද්‍රව්‍යයක් වන්නේ
(1) දිවුල් ය. (2) අලිගැටපේර ය. (3) පොල් ය. (4) දොඩම් ය.

**4.** මින් කුමන ඛනිජයක ඌනතාව ගර්භණී අවධියේ දී මළදරු උපත් සහ ප්‍රාග් පරිණත දරු උපත් ඇතිවීමට හේතු වන්නේ ද?
(1) අයඩීන් (2) කැල්සියම් (3) සෝඩියම් (4) මැග්නීසියම්

**5.** විටමින් $B_3$ හි රසායනික නාමය වනුයේ
(1) තයමීන් ය. (2) රයිබොෆ්ලේවින් ය. (3) නියසීන් ය. (4) පිරිඩොක්සින් ය.

**6.** පහත කරුණු සලකන්න.
- මේදයෙහි දිය වේ.
- කිරි සහ බටර්වල අඩංගු ය.
- අස්ථි වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වේ.

මෙම කරුණු හා සම්බන්ධ විටමිනය කුමක් ද?
(1) විටමින් A (2) විටමින් C (3) විටමින් D (4) විටමින් K

**7.** ප්‍රෝටීන් පරිපූරණය සඳහා ධාන්‍ය හා මාෂබෝග සංයෝජනය කිරීමේ දී දායකවන ඇමයිනෝ අම්ල දෙක වනුයේ
(1) වැලීන් හා ලයිසීන් ය.
(2) මෙතියොනීන් හා ලියුසීන් ය.
(3) වැලීන් හා ලියුසීන් ය.
(4) ලයිසීන් හා මෙතියොනීන් ය.

**8.** කාබොහයිඩ්‍රේට්, කැල්සියම් හා විටමින් $B_2$ අඩංගු වන ආහාර ද්‍රව්‍යය කුමක් ද?
(1) මස් (2) මාළු (3) කිරි (4) බිත්තර

[දෙවැනි පිටුව බලන්න.

**9.** ආහාර ද්‍රව්‍යයක පෝෂණ අගය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
- තන්තු බහුල ය.
- යකඩ අඩංගු ය.
- විටමින් C වල ප්‍රභවයකි.

මෙම ආහාර ද්‍රව්‍යය වන්නේ

(1) කැරට් ය. (2) බතල ය. (3) පේර ය. (4) ගොටුකොළ ය.

**10.** ග්‍රහණිය තුළ සිදුවන ජීරණ ක්‍රියාව කුමක් ද?

(1) පොලිසැකරයිඩ —ඇමයිලේස්→ ඩයිසැකරයිඩ

(2) ප්‍රෝටීන් —පෙප්සින්→ පෙප්ටෝන

(3) ඩයිපෙප්ටයිඩ —පෙප්ටිඩේස්→ ඇමයිනෝ අම්ල

(4) ඩයිසැකරයිඩ —සුක්රේස්, ලැක්ටේස්, මොල්ටේස්→ මොනොසැකරයිඩ

**11.** මේද ජීරණය හා සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) මේද ජීරණය සඳහා ලයිපේස් එන්සයිමය අවශ්‍ය වේ.

(2) පිත් යුෂය මේද තෛලෝදකරණය සඳහා ක්‍රියා කරයි.

(3) පිත් යුෂය නිපදවනුයේ පිත්තාශය තුළ ය.

(4) ක්ෂුද්‍රාන්ත්‍රය තුළ දී මේද ජීරණය අවසාන වේ.

**12.** දෛනික පෝෂණ අවශ්‍යතා සටහන පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කැල්සියම් අවශ්‍යතාව ග්‍රෑම්වලින් දක්වා ඇත.

(2) ගර්භණී හා ක්ෂීරණ අවධිවල දී ශක්ති අවශ්‍යතාව සමාන ය.

(3) මහළු අවධියේ දී ප්‍රෝටීන අවශ්‍යතාව අඩු වේ.

(4) යොවුන් වියේ ගැහැණු හා පිරිමි ළමුන්ගේ විටමින් A අවශ්‍යතාව සමාන ය.

**13.** මින් අඩු ම උෂ්ණත්වයක් උපයෝගී වන්නේ, කුමන පිසීමේ ක්‍රමයෙහි ද?

(1) වාෂ්පයෙන් තැම්බීම (2) ස්ටූ කිරීම (3) තැම්බීම (4) තැටියේ පිළිස්සීම

**14.** අපරදිග ක්‍රමයට අනුව ආහාර පිළිගැන්වීම සඳහා මේසය සකස් කිරීමේ දී පිඟානට වම් පසින් තබනුයේ

(1) ගැරුප්පුව පමණි. (2) හැන්ද සහ පිහිය පමණි.

(3) පිහිය පමණි. (4) හැන්ද සහ ගැරුප්පුව පමණි.

**15.** නිරක්තියට හේතුවන්නේ

(1) කැල්සියම් ඌනතාවය සහ විටමින් A ඌනතාවයයි.

(2) ෆෝලික් අම්ල ඌනතාවය සහ විටමින් C ඌනතාවයයි.

(3) සින්ක් ඌනතාවය සහ විටමින් K ඌනතාවයයි.

(4) යකඩ ඌනතාවය සහ විටමින් E ඌනතාවයයි.

**16.** ඌනතා රෝගයක රෝග ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
- ආසාදනවලට පහසුවෙන් ගොදුරු වීම.
- අලස බවින් යුක්ත වීම.
- උදරය සහ අත් පා ඉදිමීම.

මෙම ඌනතා රෝගය විය හැක්කේ

(1) පෙලග්‍රා ය. (2) ගලගණ්ඩය ය. (3) මැරස්මස් ය. (4) ක්වෝෂියෝකෝර් ය.

**17.** ජීව විද්‍යාත්මක හේතුවක් නිසා සිදුවන ආහාර නරක්වීමට උදාහරණයක් වන්නේ

(1) අතිසිි ගබඩා කිරීම නිසා සිදුවන තෙල් මුඩුවීමයි.

(2) දින කිහිපයක් විවෘතව තැබීම නිසා පාන් පෙත්තක මතුපිට පෘෂ්ඨය කළුපැහැ වීමයි.

(3) ඇපල් ගෙඩියක කපන ලද පෘෂ්ඨ දුඹුරුපැහැ වීමයි.

(4) පැසුණු අඹ ගෙඩියක් ඉදීම නිසා කහපැහැ වීමයි.

**18.** පරිරක්ෂිත ආහාරයක් වන තක්කාලි චට්නි පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යොදාගන්නා පරිරක්ෂණකාරක වනුයේ සීනි සහ ලුණු ය.
(2) සීනි එක්කිරීම මගින් ක්ෂුද්‍රජීවීන්ගේ වැඩීම මර්දනය වේ.
(3) ලුණු එක්කිරීම මගින් ආහාරයේ pH අගය අඩු වේ.
(4) සකස් කිරීමෙන් පසු ක්ෂණිකව ඇසුරුම් කරනු ලබයි.

**19.** නව යොවුන්වියේ ඇතිවන පොදු ද්විතියික ලිංගික ලක්ෂණයක් වන්නේ
(1) කටහඬ මිහිරි වීම ය. (2) මස්පිඬු වැඩීම ය.
(3) උස සහ බර වැඩිවීම ය. (4) උරහිස් පළල් වීම ය.

**20.** නව යෞවන අවධියේ සංවර්ධනය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ප්‍රතිඵල පිළිබඳ සිතා තීරණ ගැනීමට පෙළඹේ.
(2) අන් අය අතර කැපී පෙනීමට උත්සාහ දරයි.
(3) සිරුරට සාපේක්ෂව අත් පාවල වර්ධනය වේගයෙන් සිදු වේ.
(4) ගැහැණු හා පිරිමි දරුවන් එකම වයසක දී යෞවනෝදයට එළඹේ.

**21.** යොවුන්වියේ සමස්ත සංවර්ධනය සලකා බැලීමේ දී අස්ථාවර මෙන් ම පසුබෑමේ ස්වභාවයක් නිරීක්ෂණය වන්නේ
(1) කායික වර්ධනයෙහි ය. (2) සමාජ වර්ධනයෙහි ය.
(3) බුද්ධි වර්ධනයෙහි ය. (4) චිත්තවේග වර්ධනයෙහි ය.

**22.** පහත දැක්වෙන ලිංගික සම්ප්‍රේෂණ රෝග අතුරෙන් සුව කළ **නොහැකි** රෝගය කුමක් ද?
(1) උපදංශය (2) ඒඩ්ස් රෝගය (3) සුදු බිංදුම (4) ක්ලැමීඩියා

**23.** ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය හා සම්බන්ධ නිවැරදි කරුණ කුමක් ද?
(1) පරිණත ඩිම්බ, ඩිම්බකෝෂ තුළ ගබඩාකර තබා ගනී.
(2) දින 28කට වරක් එක් ඩිම්බ කෝෂයකින් පරිණත ඩිම්බයක් මුදාහරියි.
(3) ඩිම්බකෝෂ සැදීමත් සමග ම ඊස්ට්‍රජන් හා ප්‍රොජෙස්ටරෝන් හෝමෝන නිපදවීම ආරම්භ වේ.
(4) සංසේචනයෙන් පසුව සැදුණු යුක්තාණුව ගර්භාෂය තුළ අධිරෝපණය වේ.

**24.** ගර්භණී මවකට පූර්ව ප්‍රසව සායනයකින් ලබාදෙන පෝෂකයක් වන්නේ
(1) විටමින් A ය. (2) විටමින් C ය. (3) විටමින් D ය. (4) විටමින් E ය.

**25.** ගර්භණී අවස්ථාවක දී පූර්ව ප්‍රසව සායනයක එක්වරක් පමණක් පරීක්ෂා කරනුයේ
(1) රුධිර ඝනයයි.
(2) රුධිර ග්ලූකෝස් මට්ටමයි.
(3) රුධිර පීඩනයයි.
(4) රුධිර හිමොග්ලොබීන් මට්ටමයි.

**26.** නවජ දරුවා ලෙස හඳුන්වනුයේ ඉපදීමෙන් පසු
(1) මුල් දින දෙක තුළ දරුවා ය. (2) මුල් සතිය තුළ දරුවා ය.
(3) මුල් සති දෙක තුළ දරුවා ය. (4) මුල් සති හතර තුළ දරුවා ය.


**27.** 'කොලොස්ට්‍රම්' පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.
(1) ළදරුවාගේ ප්‍රතිශක්තිය සඳහා වැදගත් වේ.
(2) මව්කිරිවල අඩංගු අත්‍යවශ්‍ය මේද අම්ලයකි.
(3) මුල් මාස කිහිපය තුළ ශ්‍රාවය වන මව්කිරි වේ.
(4) මව්කිරිවල අඩංගු හෝමෝනයකි.

**28.** ක්ෂීරණ අවධියේ දී මව්කිරි නිෂ්පාදනය සඳහා වැදගත්වන හෝමෝනය කුමක් ද?
(1) ඇන්ඩ්‍රොජන් (2) ඊස්ට්‍රජන් (3) ප්‍රෝලැක්ටින් (4) තයිරොක්සින්

**29.** ළදරුවන් හට ලබාදෙන පංචසංයුජ එන්නත මගින් වළක්වන රෝග දෙකක් වන්නේ
(1) කක්කල් කැස්ස සහ පිටගැස්ම ය. (2) සරම්ප සහ හෙපටයිටිස් B ය.
(3) ගලපටලය සහ රුබෙල්ලා ය. (4) කම්මුල්ගාය සහ ක්ෂය රෝගය ය.

**30.** විවිධ මැහුම්ක්‍රම හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පිස්මේන්තු මැස්ම අද්දර නිමකිරීම සඳහා සුදුසු වේ.
(2) සිහින් නූල් දුවවීම තාවකාලික මැහුම් ක්‍රමයක් ලෙස හැඳින්වේ.
(3) හුරුළුකටු මැස්ම සේයාවැඩ සඳහා භාවිත වේ.
(4) සන්නාලි මැස්මෙහි ගමන්ගන්නා නූල නොපිටින් දිස් නොවේ.

**31.** මෙම රූපසටහනෙන් දක්වා ඇත්තේ



(1) දම්වැල් මැස්ම ය.
(2) බ්ලැන්කට් මැස්ම ය.
(3) නැටි මැස්ම ය.
(4) කතිර මැස්ම ය.

**32.** පහත කරුණු සලකන්න.
A – මැහුම් නියැදි මැසීමේ දී වඩාත් සැලකිලිමත් විය යුත්තේ රෙද්දෙහි හොඳපිට නිමාව පිළිබඳව ය.
B – කතිර මැස්ම මැසීමට පෙර රෙද්දෙහි දික්නූල් කිහිපයක් ඉවත් කළ යුතු ය.
C – කපුරෙදිවල විවිධත්වය එහි වියමන හා නිමාව මත රඳා පවතී.
මේවායින් නිවැරදි කරුණ/කරුණු වන්නේ
(1) A පමණි. (2) C පමණි. (3) A හා B පමණි. (4) B හා C පමණි.

**33.** කපු කෙඳි/කපු රෙදිවල ගුණාංගයක් වන්නේ මින් කුමක් ද?
(1) තදින් ඇදීමේ දී කැඩුණු අද්දර තියුණු කොන් දිස්වේ.
(2) අත ගා බැලීමේ දී ඇදෙනසුළු බවක් දැනේ.
(3) මැදීමේ දී වැඩි උෂ්ණත්වයක් භාවිත කළ හැකි ය.
(4) ජලයට ඇමූ විට සෙමින් තෙත්වීම සිදුවේ.

**34.** ළදරු ඇඳුමක් (baby shirt) සඳහා වඩාත් සුදුසු රෙදි වර්ග දෙකක් වන්නේ
(1) වොයිල් සහ ලිනන් ය. (2) ලිනන් සහ පොප්ලින් ය.
(3) පොප්ලින් සහ මල්පීස් ය. (4) මල්පීස් සහ වොයිල් ය.

**35.** නිවසේ නාන කාමරයක පෞද්ගලිකත්වය ආරක්ෂාවීම සඳහා වඩාත් සුදුසු වන්නේ
(1) ෆෑන් ලයිට් යෙදීම ය. (2) ජනේල යෙදීම ය. (3) ග්‍රිල් යෙදීම ය. (4) වා කවුළු යෙදීම ය.

**36.** නිවසක සංවාතන ක්‍රියාවලිය සඳහා වඩාත් ම වැදගත් කරුණ කුමක් ද?
(1) බිත්තිවල උස අඩු කිරීම (2) කඳුබෑවුම් ආසන්නයේ ඉදිකිරීම
(3) සිසිල් වර්ණ ආලේප කිරීම (4) මැද මිදුල් හා පොකුණු සෑදීම

**37.** නිවසක ජනෙල් සඳහා පාරභාෂක වීදුරු යෙදීම වඩාත් සුදුසු වන්නේ
(1) මුළුතැන්ගෙය සඳහා ය. (2) විසිත්ත කාමරය සඳහා ය.
(3) නිදන කාමර සඳහා ය. (4) කෑම කාමරය සඳහා ය.

**38.** අන්තර් මධ්‍යමික වර්ණය කුමක් ද?
(1) කහ දම් (2) නිල් තැඹිලි (3) රතු තැඹිලි (4) රතු කොළ

**39.** ගෘහීය සම්පත් කළමනාකරණ ක්‍රියාවලියේ නිවැරදි පියවර අඩංගු වරණය තෝරන්න.
(1) සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ ඇගයීම.
(2) සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.
(3) නිරීක්ෂණය කිරීම, ක්‍රියාත්මක කිරීම, සංවිධානය කිරීම සහ ඇගයීම.
(4) සැලසුම් කිරීම, සංවිධානය කිරීම, නිරීක්ෂණය කිරීම සහ ඇගයීම.

**40.** ගෘහීය අයවැය ලේඛනයක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණක් **නොවන්නේ**
(1) පවුලේ සාමාජික සංඛ්‍යාව ය. (2) ඉතිරි කිරීම ය.
(3) අතිරේක වියදම් ය. (4) සාමාජිකයන්ගේ ස්ත්‍රී/පුරුෂ භාවය ය.

**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations Sri Lanka Department of Examinations Sri Lanka Department of Examinations Sri Lanka

**85 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

| | |
|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව | I, II |
| மனைப் பொருளியல் | I, II |
| Home Economics | I, II |

## ගෘහ ආර්ථික විද්‍යාව II

* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවන** ප්‍රශ්නයට ලකුණු **20** ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

මව, පියා සහ කුඩා දියණියන් දෙදෙනෙක් සිටින මධ්‍යම පාන්තික පවුලකි. අවුරුදු 4ක් වයසැති වැඩිමහල් දියණිය පෙර පාසල් යයි. කුඩා දියණියගේ වයස මාස පහකි. පියා පෞද්ගලික ආයතනයක ආරක්ෂක නිලධාරියෙකු ලෙස සේවය කරයි. මව කාර්යබහුල ගෘහණියකි. මොවුන්ගේ නිවස කාමර හතරකින් සමන්විත වුව ද එය මනාව සංවිධානය කර ඇත.

(i) පෙර පාසල් දරුවාගේ විශේෂ පෝෂණ අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න.

(ii) වැඩිමහල් දියණියගේ හතරවැනි උපන්දින සාදය සඳහා පෙර පාසලට රැගෙන යාමට සුදුසු පරීක්ෂණය කරන ලද ආහාරයක් නම් කර, එම ආහාරයේ අඩංගු පෝෂ්‍ය පදාර්ථයක් සඳහන් කරන්න.

(iii) පියාට උදේ ආහාරය සඳහා රැකියාවට රැගෙන යා හැකි වාෂ්පයෙන් තම්බන ලද ප්‍රධාන ආහාර වර්ග **දෙකක්** ලියන්න.

(iv) මව නීරක්තියෙන් පෙළෙන බව පවුල් සෞඛ්‍ය නිලධාරිනිය පැවසුවාය. මව තුළින් දිස් වූ රෝග ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(v) කුඩා දරුවාගේ ළදරු කමිසයට (baby shirt) වාටි මැස්ම ලෙස යොදා ගත හැකි අලංකාරය ගෙන දෙන මැහුම් ක්‍රම **දෙකක්** නම් කරන්න.

(vi) කුඩා දියණියගේ උපත් බර කි.ග්‍රෑම් 2.8ක් විය. ඇයට අවුරුද්දක් වයස වනවිට අපේක්ෂිත ශරීර බර කොපමණ ද?

(vii) මාස පහක් වූ කුඩා දරුවා සඳහා සුදුසු ක්‍රීඩා භාණ්ඩ **දෙකක්** ලියන්න.

(viii) නිවස තුළ දී මෙම දරුවන් මුහුණ දියහැකි හදිසි අනතුරු **දෙකක්** සඳහන් කරන්න.

(ix) මොවුන්ගේ නිවසෙහි සංවිධානය කර ඇති බහුකාර්ය ඒකක **දෙකක්** ලියන්න.

(x) හරස් සංවාතනය යනු කුමක් ද? මෙම නිවසෙහි හරස් සංවාතනය පිළිඹිබු වන අවස්ථාවක් සඳහන් කරන්න.

**2.** (i) ඇඳුමක වාටියක් මසා නිම කිරීමේ දී අනුගමනය කරන පියවර **තුනක්** සඳහන් කරන්න.

(ii) කෙඳි වර්ගීකරණයට අනුව මිනිසා විසින් සාදන ලද කෙඳි වර්ග **දෙකක්** නම් කර, ඒ එකිනෙකට උදාහරණ **එකක්** බැගින් දක්වන්න.

(iii) සටහන් ලියන්න.

(a) ළදරු ඇඳුමක තිබිය යුතු විශේෂ ලක්ෂණ

(b) මැහුම් නියැදි සකස් කිරීම

**3.** (i) 'ආහාර' යන්න අර්ථ දක්වන්න.

(ii) ආහාර පිළියෙල කිරීමේ දී ඒවායේ ගුණාත්මක ලක්ෂණ ආරක්ෂා කර ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු **තුනක්** ලියන්න.

(iii) අමුත්තෙකු සඳහා සුදුසු විශේෂ දිවා ආහාරවේලක බොජුන් පතක් සැලසුම් කරන්න.

**4.** (i) කුඩා අවධියේ ඇතිවන කැල්සියම් ඌණතාවයෙහි රෝග ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(ii) 'දෛනික ආහාරයේ තන්තු ඇතුළත් කිරීම වැදගත් ය.' මීට හේතු **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) දරුවන් අතර මන්දපෝෂණ තත්ත්වය ඇතිවීමට බලපාන කරුණු **හතරක්** පැහැදිලි කරන්න.

**5.** (i) මනා ගෘහීය සම්පත් කළමනාකරණය තුළින් පවුලේ සාමාජිකයන්ට සැලසෙන වාසි **තුනක්** සඳහන් කරන්න.

(ii) 'කාලය සහ විදුලිය, ගෘහ කළමනාකරණයේ දී වැදගත් වන සම්පත් දෙකකි.' ගෘහීය කාර්යයන්හි දී විද්‍යුත් ශක්තිය යොදා ගැනෙන විවිධ ආකාර **තුනක්** උදාහරණ සහිතව දක්වන්න.

(iii) නිවෙස් අලංකරණයේ දී විධිමත් හා අවිධිමත් තුලනය පිළිබිඹු වන අවස්ථා **එක** බැගින් රූප සටහන් මගින් ඉදිරිපත් කරන්න.

**6.** (i) ගර්භණී අවධියේ අවදානම් සාධක **තුනක්** සඳහන් කරන්න.

(ii) ළදරුවාට අතිරේක ආහාර පිළියෙල කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු **තුනක්** ලියන්න.

(iii) ළදරු අවධිය තුළ සිදුවන සමාජ වර්ධනය කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

**7.** (i) 'ආර්ථවහරණය' හඳුන්වන්න.

(ii) නවජ දරුවෙකු තුළ ඇතිවන සංවේදන **තුනක්** සඳහන් කර, ඒ එකිනෙකට දක්වන ප්‍රතීක ක්‍රියාව බැගින් ලියන්න.

(iii) 'සමවයස් සබඳතා යොවුන් දරුවාගේ සංවර්ධනය කෙරෙහි ධනාත්මකව හා ඍණාත්මකව බලපෑම් ඇති කරයි.' කරුණු **හතරක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහසයයි
அந்தரங்கமானது

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
# க.பொ.த. (சாதாரண தர)ப் பரீட்சை - 2022 (2023)

විෂය අංකය / பாட இலக்கம்: **85** විෂයය / பாடம்: **மனைப் பொருளியல்**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 4 | 31. | 1 |
| 02. | 3 | 12. | 4 | 22. | 2 | 32. | 2 |
| 03. | 2 | 13. | 2 | 23. | 2 | 33. | 3 |
| 04. | 1 | 14. | 1 | 24. | 2 | 34. | 4 |
| 05. | 3 | 15. | 2 | 25. | 1 | 35. | 1 |
| 06. | 3 | 16. | 4 | 26. | 4 | 36. | 4 |
| 07. | 4 | 17. | 2 | 27. | 1 | 37. | 3 |
| 08. | 3 | 18. | 2 | 28. | 3 | 38. | 3 |
| 09. | 4 | 19. | 3 | 29. | 1 | 39. | 2 |
| 10. | 1 | 20. | 4 | 30. | 3 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන කිරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | | | |
|---|---|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)

## 85 - ගෘහ ආර්ථික විද්‍යාව

**1.** පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

මව, පියා සහ කුඩා දියණියන් දෙදෙනෙක් සිටින මධ්‍යම පාන්තික පවුලකි. අවුරුදු 4ක් වයසැති වැඩිමහල් දියණිය පෙර පාසල් යයි. කුඩා දියණියගේ වයස මාස පහකි. පියා පෞද්ගලික ආයතනයක ආරක්ෂක නිලධාරියෙකු ලෙස සේවය කරයි. මව කාර්යබහුල ගෘහණියකි. මොවුන්ගේ නිවස කාමර හතරකින් සමන්විත වුව ද එය මනාව සංවිධානය කර ඇත.

(i) පෙර පාසල් දරුවාගේ විශේෂ පෝෂණ අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

- ශක්ති අවශ්‍යතාවය
- යකඩ අවශ්‍යතාවය
- කැල්සියම් අවශ්‍යතාවය
- ප්‍රෝටීන් අවශ්‍යතාවය
- විටමින් A අවශ්‍යතාවය (ප්‍රෝටීන් ශක්ති ඌනතාවය විටමින් A ඌනතාව වේ.)

කරුණු 2ට ලකුණු 02

(ii) වැඩිමහල් දියණියගේ හතරවැනි උපන්දින සාදය සඳහා පෙර පාසලට රැගෙන යාමට සුදුසු පරීක්ෂණය කරන ලද ආහාරයක් නම් කර, එම ආහාරයේ අඩංගු පෝෂ්‍ය පදාර්ථයක් සඳහන් කරන්න.

- පොල් රොටි - මේදය, කාබෝහයිඩ්‍රේට
- අල රොටි - කාබෝහයිඩ්‍රේට
- කිරිරොටි - ප්‍රෝටීන්, කාබෝහයිඩ්‍රේට
- මාෂ්මෙලෝස් - ප්‍රෝටීන්, කාබෝහයිඩ්‍රේට
- පුහුල් දෝසි - කාබෝහයිඩ්‍රේට
- බූන්දි - මේදය, කාබෝහයිඩ්‍රේට
- දොදොල් - මේදය, කාබෝහයිඩ්‍රේට
- මස්කට් - මේදය, කාබෝහයිඩ්‍රේට
- හෝර්ලික්ස් - විටමින් C, A කාබෝහයිඩ්‍රේට
- කිරි පැකට් - ප්‍රෝටීන්, කිරි කාබෝහයිඩ්‍රේට
- බිස්කට් විටමින් A, B

කරුණු 2ට ලකුණු 02

ලකුණු 1+1 = 2

(iii) පියාට උදේ ආහාරය සඳහා රැකියාවට රැගෙන යා හැකි වාෂ්පයෙන් තම්බන ලද ප්‍රධාන ආහාර වර්ග දෙකක් ලියන්න.

- ඉදි ආප්ප
- පොල් පිට්ටු / මනිපිට්ටු / ස්වර පිට්ටු/ කුරක්කන් පිට්ටු
- ඉඩලි
- කොළ කැවිලි
- ඩම්ප්ලින්

කරුණු 2කට ලකුණු 02

**(iv) මව නිරක්තියෙන් පෙළෙන බව පවුල් සෞඛ්‍ය නිලධාරිනිය පැවසුවාය. මව තුළින් දිස් වූ රෝග ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.**

- අලස බව
- සුදු මැලි බව
- වෙහෙසට පත්වීම / මහන්සිය
- හෘද ස්පන්දන වේගය වැඩි වීම
- කෙහෙට්ටුව
- හතිය
- දුර්වල පෙනුම

කරුණු 2කට ලකුණු 02

**(v) කුඩා දරුවාගේ ළදරු කමිසයට (baby shirt) වාටි මැස්ම ලෙස යොදා ගත හැකි අලංකාරය ගෙන දෙන මැහුම් ක්‍රම දෙකක් නම් කරන්න.**

- සිප්පි වාටි මැස්ම
- බ්ලැන්කට් මැස්ම
- ඇඹරුම් මැස්ම

කරුණු 2 කට ලකුණු 02

**(vi) කුඩා දියණියගේ උපත් බර කි.ග්‍රෑම් 2.8ක් විය. ඇයට අවුරුද්දක් වයස වනවිට අපේක්ෂිත ශරීර බර කොපමණ ද?**

8.4kg

(2.8 kg x 3 = 8.4kg)

ලකුණු 02

**(vii) මාස පහක් වූ කුඩා දරුවා සඳහා සුදුසු ක්‍රීඩා භාණ්ඩ දෙකක් ලියන්න.**

මිහිරි නාද නගන, චලනය වන, පැහැපත්, වර්ණවත් ක්‍රීඩා භාණ්ඩ

මේවාට අදාළ ක්‍රීඩා භාණ්ඩ සඳහා ලකුණු ලබා දෙන්න.

කරුණු 2කට ලකුණු 02

**(viii) නිවස තුළ දී මෙම දරුවන් මුහුණ දියහැකි හදිසි අනතුරු දෙකක් සඳහන් කරන්න.**

- වැටීම
- පිළිස්සීම
- උගුර, නාසය තුළ යමක් හිරකර ගැනීම
- විදුලියෙන් වන හානි
- ආයුධ වලින් වන හානි කැපීම / තැලීම
- විෂ ද්‍රව්‍ය පෙවීම
- ජලයෙන් සිදුවන හානි

කරුණු 2 කට ලකුණු 02



Scanned with CamScanner

**(ix) මොවුන්ගේ නිවසෙහි සංවිධානය කර ඇති බහුකාර්ය ඒකක දෙකක් ලියන්න.**

- විසිත්ත කාමරයේ කොටසක් කෑම කාමරය සඳහා වෙන් කිරීම
- විසිත්ත කාමරයේ කොටසක් පෙර පාසල් දරුවාගේ ක්‍රියාකාරකම් සඳහා භාවිත කිරීම
- මුළුතැන්ගෙයි කොටසක් ගබඩා කාමරය ලෙස භාවිත කිරීම
- මුළුතැන්ගෙයි කොටසක් කෑම කාමරය සඳහා භාවිත කිරීම

**කරුණු 2කට ලකුණු 02**

**(x) හරස් සංවාතනය යනු කුමක් ද? මෙම නිවසෙහි හරස් සංවාතනය පිළිබිඹු වන අවස්ථාවක් සඳහන් කරන්න.**

- හරස් සංවාතනය යනු කාමරයකට හෝ ශාලාවකට එක් පැත්තකින් වාතය ඇතුළු වී ඊට සමාන්තර අනෙක් පැත්තෙන් වාතය පිට වී යාමේ ක්‍රියාවලියයි.

  මෙම නිවසේ විසිත්ත කාමරයේ දොර ජනේල් එසේ මුහුණට මුහුණ ලා යොදා තිබීම එවැනි අවස්ථාවකි.

පැහැදිලි කිරීමට ලකුණු 01
උදාහරණයට ලකුණු 01
(ලකුණු 2 x 10 = 20)



Scanned with CamScanner

**2. (i) ඇඳුමක වාටියක් මසා නිම කිරීමේ දී අනුගමනය කරන පියවර තුනක් සඳහන් කරන්න.**

- වාටිය නැමීම දෙවරක් නැමීම (ඇලිවෙල, ...)
- තූල් ඇදීම
- වාටි මැස්මක් මසා නිම කිරීම

**එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03**

**(ii) කෙඳි වර්ගීකරණයට අනුව මිනිසා විසින් සාදන ලද කෙඳි වර්ග දෙකක් නම් කර, ඒ එකිනෙකට උදාහරණ එකක් බැගින් දක්වන්න.**

- **අර්ධ කෘතිම කෙඳි**
- **රෙයෝන්**
  - විස්කෝස් රෙයෝන්
  - කියුප්‍රා ඇමෝනියම් රෙයෝන්
  - සෙලියුලෝස් ඇසිටේට් රෙයෝන්
  - නයිට්‍රෝ සෙලියුලෝස් රෙයෝන්
- **කෘතිම කෙඳි**
  - පොලිමයිඩ් - නයිලෝන්
  - පොලිඑස්ටර් - ටෙරලීන්
  - ඇක්‍රිලික් - ඕර්ලෝන්
- **වෙනත් කෙඳි**
  - රන්
  - රිදී
  - වීදුරු

කෙඳි වර්ග 2ට ල. 2
උදාහරණ 2ට ½ බැගින්

**කෙඳි වර්ග දෙකක් නම් කිරීමට ලකුණු $1\frac{1}{2}$**

උදාහරණ දෙකට ලකුණු $1\frac{1}{2}$

මුළු ලකුණු - 03

**(iii) සටහන් ලියන්න.**

**(a) ළදරු ඇඳුමක තිබිය යුතු විශේෂ ලක්ෂණ**

(a)

- මූට්ටු අවම වීම
- පැතලි මූට්ටුව යෙදීම
- විවර පියවීම සඳහා ටේප් හෝ රිබන් ඇල්ලීම
- සිනිඳු කපු වැනි රෙදිවලින් නිර්මාණය වී තිබීම
- ලා පාට වීම
- පන්නය සරල වීම
- ලිහිල් වීම
- ඇඟලෑමට හා ගැලවීමට පහසු වීම

**කරුණු 02 ට ලකුණු 02**



Scanned with CamScanner

**(b) මැහුම් නියැදි සකස් කිරීම**

- ලා පාට කපු රෙදි තෝරා ගැනීම
- ගැලපෙන වර්ණවල නූල් භාවිතය
- නියැදි නියමිත දිග හා පළලින් යුක්ත වීම
- හොඳපිට හා නොපිට ක්‍රමවත් වීම
- මැහුම්වල නිවැරදි ආරම්භය හා අවසානය
- මැස්ම ඒකාකාරී බවින් යුක්ත වීම
- මැස්ම පැහැදිලිව හඳුනා ගත හැකි වීම

කරුණු දෙකට ලකුණු 02

මුළු ලකුණු 10

**3. (i) 'ආහාර' යන්න අර්ථ දක්වන්න.**

සිරුරට අවශ්‍ය ශක්තිය ලබා දීම, වර්ධනය සහ පැවැත්ම, ලෙඩරෝග වලින් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කරන සිරුරට විෂ නොවන ඝන හෝ ද්‍රව වශයෙන් ලබා ගන්නා ද්‍රව්‍ය "ආහාර" ලෙස හැඳින්වේ.

(ලකුණු 03)

**(ii) ආහාර පිළියෙල කිරීමේ දී ඒවායේ ගුණාත්මක ලක්ෂණ ආරක්ෂා කර ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.**

- කැපීමට පෙර සේදීම (ලුණු හෝ ක්ලෝරීන් පෙති යෙදූ ජලයෙන් සේදීම)
- එඩාත් සිහින්ව නොකැපීම
- අමුවෙන් ආහාරයට ගන්නා විට ඊට ආසන්නයේම කැපීම
- පිරිසිදු හා සුදුසු උපකරණ හා මෙවලම් භාවිතය
- ආහාර සමඟ ප්‍රතික්‍රියා නොකරන බඳුන් හා මෙවලම් භාවිතය
- රස ගැන්වීමේදී දේශීය ස්වාභාවික කුළුබඩු භාවිතය.

කරුණු 3කට ලකුණු 03

**(iii) අමුත්තෙකු සඳහා සුදුසු විශේෂ දිවා ආහාරවේලක බොජුන් පතක් සැලසුම් කරන්න.**

- විශේෂ බත් වර්ගයක් වීම
- ඊට ගැළපෙන අනෙකුත් ආහාර තෝරා ගැනීම
- විවිධත්වය - වර්ණය / වයනය/ රසය / පිසීමේ ක්‍රම ආදියෙහි
- අධික දියරමය ආහාර නොතිබීම
- සලාද, චට්නි, මෝජු, අච්චාරු ආදිය ගැලපෙන සේ යොදා ගැනීම
- අතුරුපසක් අනිවාර්ය වීම

කරුණු 4කට ලකුණු 04

මුළු ලකුණු 10



Scanned with CamScanner

**4. (i) කුඩා අවධියේ ඇතිවන කැල්සියම් ඌනතාවයෙහි රෝග ලක්ෂණ තුනක් සඳහන් කරන්න**

- දත් ඒම ප්‍රමාද වීම
- ඇවිදීම ප්‍රමාද වීම
- කකුල් බකල් වීම
- ගැටෙන දණහිස් සහිත වීම
- මැණික් කටුව, වළලුකර වැනි සන්ධි ඉදිමීම
- පර්ශු ඒකාකාරී ලෙස වර්ධනය නොවීම නිසා පර්ශුවල දිලිසෙන පබළු වැනි කොටස් දිස්වීම

කරුණු 3කට ලකුණු 03

**(ii) 'දෛනික ආහාරයේ තන්තු ඇතුළත් කිරීම වැදගත් ය.' මීට හේතු තුනක් ඉදිරිපත් කරන්න.**

- මලබද්ධය වළක්වාලීම / අන්ත්‍ර තුළ ක්‍රමාකුංචන ක්‍රියාවලිය වේගවත් කරයි.
- කුසගින්න ඇතිවීම ප්‍රමාද කිරීම / තෘප්තිය වැඩි බව
- ආන්ත්‍රික පිළිකා ඇතිවීම වළක්වයි.
- බෝ නොවන රෝග ඇතිවීම වළක්වා ගැනීම (දියවැඩියාව, අධි රුධිර පීඩනය, පිළිකා, හෘද රෝග, කොලෙස්ටරෝල් පාලනය)
- ස්ථුලතාවය ඇතිවීම වළක්වා ගැනීම

කරුණු 3කට ලකුණු 03

**(iii) දරුවන් අතර මන්දපෝෂණ තත්ත්වය ඇතිවීමට බලපාන කරුණු හතරක් පැහැදිලි කරන්න.**

- අයහපත් ආර්ථික තත්ත්වය
- නූගත්කම / නොදැනුවත්කම
- නොසැලකිලිමත්කම
- පෝෂණය හා සම්බන්ධ දැනුම හා ආකල්ප නොමැති බව
- අයහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම
- දරුවන් අතර වයස් පරතරය අඩු වීම
- යෞවනවියේ ගැබ්ගැනීම
- සෞඛ්‍ය සේවා නොලැබී යාම
- දරුවන්ට අතිරේක ආහාර දීම ප්‍රමාද කිරීම
- පණුරෝග වැනි ආසාදනවලින් පෙළීම
- නිතර රෝගී වීම
- කුඩාකළ නිසි පෝෂණයක් නොලැබීම

කරුණු 4කට ලකුණු 04

මුළු ලකුණු 10



Scanned with CamScanner

5. (i) මනා ගෘහීය සම්පත් කළමනාකරණය තුළින් පවුලේ සාමාජිකයන්ට සැලසෙන වාසි තුනක් සඳහන් කරන්න

- පවුලේ අවශ්‍යතා හා අපේක්ෂා ඉටු වීම
- පවුලේ සාමාජිකයන් තෘප්තිමත් වීම /
- ගෘහ කාර්යයන් සාර්ථකව ඉටු කර ගත හැකි වීම /
- පවුල තුළ අන්‍යෝන්‍ය අවබෝධය ලබා ගත හැකි වීම
- පවුලේ සමගිය, සහයෝගීතාවය ඇතිවීම
- ගෘහයේ මනා සැලසුමක් හා සංවිධානයක් ඇතිවීම /

කරුණු 3 ට ලකුණු 3යි.

(ii) 'කාලය සහ විදුලිය, ගෘහ කළමනාකරණයේ දී වැදගත් වන සම්පත් දෙකකි.' ගෘහීය කාර්යයන්හි දී විද්‍යුත් ශක්තිය යොදා ගැනෙන විවිධ ආකාර තුනක් උදාහරණ සහිතව දක්වන්න.


- ආලෝකය ලබා ගැනීම - විදුලි බල්බ
- තාප ශක්තිය ලබා ගැනීම - උඳුන් , අවන්, වෝස්ටර්, විදුලි කේතල්, හීටර්
- යාන්ත්‍රික ශක්තිය - බ්ලෙන්ඩරය, විද්‍යුත් බීටරය, විදුලි පංකාව, ග්‍රයින්ඩරය, පොල්ගාන උපකරණය, ජල මෝටරය
- ධ්වනි ශක්තිය - විදුලි සීනුව

ආකාර 03 ට ලකුණු $1\frac{1}{2}$


උදාහරණ 03 ට ලකුණු 03යි

(iii) නිවෙස් අලංකරණයේ දී විධිමත් හා අවිධිමත් තුලනය පිළිබිඹු වන අවස්ථා එක බැගින් රූප සටහන් මගින් ඉදිරිපත් කරන්න.

විධිමත් තුලනය



අවිධිමත් තුලනය



මෙබඳු රූපසටහන් සඳහා ලකුණු ලබා දෙන්න

ලකුණු 2 x 2 = 4

මුළු ලකුණු 10

Scanned with CamScanner

6. (i) ගර්භණී අවධියේ අවදානම් සාධක තුනක් සඳහන් කරන්න.

- දිය වැඩියාව
- අධිරුධිර පීඩනය
- ඇදුම
- මවගේ වයස අඩු හෝ වැඩි බව
- සමාජ රෝග
- උස අඩු බව
- සංජානීය රෝග (තැලසීමියාව, හිමෝෆීලියාව)
- බර අඩු හෝ වැඩි බව

කරුණු 3 ට ලකුණු 03

(ii) ළදරුවාට අතිරේක ආහාර පිළියෙල කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු තුනක් ලියන්න.

- ප්‍රමාණය මෙන්ම පෝෂණ ගුණය ක්‍රමයෙන් වැඩි කිරීම
- ලුණු හා සීනි එකතු නොකිරීම
- විවිධත්වයෙන් යුත් ආහාර එකතු කිරීම
- අර්ධ ඝන ආහාරයෙන් ආරම්භ කර ක්‍රමයෙන් ඝන තත්වයට පත් කිරීම
- ජීර්ණය වීමේ පහසුව
- පිරිසිදු උපකරණ හා මෙවලම් භාවිතය
- විවිධ ආහාර ක්‍රමයෙන් එකතු කිරීම / දෛනික ආහාරයට අනුරූප ආහාර එකතු කිරීම.

කරුණු 3 ට ලකුණු 03

(iii) ළදරු අවධිය තුළ සිදුවන සමාජ වර්ධනය කරුණු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

- මව හඳුනා ගැනීම.
- පියා ඇතුළු නිවසේ අය හඳුනා ගැනීමට යොමුවේ.
- නිතර හමුවන දරුවන් පිළිබඳ උනන්දුවක් දක්වයි.
- අන් අය සමග සිනාසීමට යොමු වේ.
- දරුවන් සමග සෙල්ලමට කැමැත්තක් දක්වයි.
- කණ්ණාඩිය තුළින් දිස්වන ප්‍රතිබිම්බයට ප්‍රතිචාර දක්වයි.
- අමුත්තන් දුටු විට බිය පෙන්වයි.
- කෙමෙන් මිත්‍ර වීමට පෙළඹේ.

කරුණු 4ට ලකුණු 04
මුළු ලකුණු 10

අනුපිළිවෙල සැලකිල්ල වන ලෙස ලිවිය යුතුයි.



(9) WWW.PastPapers.WiKi (8)

**7. (i) 'ආර්ථවහරණය' හඳුන්වන්න.**

වයස අ.වු. 45 - 50 පමණ වූ විට මාසිකව සිදුවන ආර්ථවය නතර වීම ආර්ථවහරණය ලෙස හැඳින්වේ. මෙය ප්‍රජනක හෝර්මෝන නිෂ්පාදනය නතර වීම නිසා සිදුවන්නකි.

ලකුණු 03

**(ii) නවජ දරුවෙකු තුළ ඇතිවන සංවේදන තුනක් සඳහන් කර, ඒ එකිනෙකට දක්වන ප්‍රතීක ක්‍රියාව බැගින් ලියන්න.**

- ශබ්දය - උදා - අධික ශබ්දයට තිගැස්සීම
- ස්පර්ශය - උදා - පියයුරු ස්පර්ශ වූ විට කිරිඋරා බීම. අත්ල ඇඟිල්ලෙන් ස්පර්ශ වූ විට මිට මොලවා ගැනීම
- දෘෂ්ඨිය - උදා - ආලෝකයට යොමු වූ විට ඇස් පියාගැනීම

සංවේදන 03 ට 1 1/2

ප්‍රතීක ක්‍රියාවට 1 1/2 ලකුණු 03

**(iii) 'සමවයස් සබඳතා යොවුන් දරුවාගේ සංවර්ධනය කෙරෙහි ධනාත්මකව හා සෘණාත්මකව බලපෑම් ඇති කරයි' කරුණු හතරක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.**

- රංචු ලැදියාව නිසා සමාජ වර්ධනය අවස්ථා ලබයි.
- අනුකරණය හා වීරාභිවන්දනය නිසා හොඳ ගතිගුණ ප්‍රගුණ කිරීමට හැකිවීම
- ස්වියත්වය ගොඩනගා ගැනීමට හැකි වීම
- සමාජයට හිතකර ශ්‍රමදාන වැනි ක්‍රියාවල නිරත වේ.
- පෞරුෂ වර්ධනයට දායක වේ.
- අන් අයට උදවු කිරීමට උනන්දු වේ.
- ආත්ම කේන්ද්‍රීය බවින් මිදීමට අවස්ථාව ලබයි.
- වගකීම් දැරීමට කැමැත්ත දක්වයි.
- නායකත්ව ලක්ෂණ ගොඩනගා ගනී.
- සමාජ සම්මතයන්ට ගරු කිරීමට පෙළඹේ

කරුණු 2 කට ලකුණු 02

**සෘණාත්මක බලපෑම්**

- විවිධ බලපෑම්වලට මුහුණදීම තුළින් ගැටළු ඇතිවේ
- අනුකරණය නිසා අයහපත් ලක්ෂණ පවා පෙන්වයි.
- පවුල් ඒකකයෙන් මිදීමට උත්සහ දරයි.
- දෙමාපියන් හා වැඩිහිටියන් සමඟ ගැටුම් ඇති කර ගනියි.
- සමාජ විරෝධී ගති ලක්ෂණ පෙන්වයි.
- විවිධ නව අත්හදා බැලීමට පෙළඹීම තුළින් අහිතකර මෙන්ම සමාජ ව්‍යසනයට පවා ගොදුරු වෙයි.

කරුණු 2 කට ලකුණු 02

මුළු ලකුණු 10

PAST PAPERS WIKI